**ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණ (IWWRMP) ව්‍යාපෘතිය - 2022**

**-----------------------------------------------------------------------------------------**

**ඒකාබද්ධ ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ (IWWRMP) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2021 අප්‍රේල් 22 දින එළඹි අංක 6621 - එල්කේ සහ 6619 - එල්කේ ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව වාරිමාර්ග අමාත්‍යාංශය විධායක නියෝජිතායතනය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, උතුරු පළාත් සභා වාරිමාර්ග දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත් සභා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ජල සම්පත් මණ්ඩලය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ.**

**ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය ප්‍රතිසංස්කරණය කිරීම, ජල සම්පත් කළමනාකරණය සඳහා ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම සහ ජල සම්පත් යටිතල පහසුකම්වල ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. වාරිමාර්ග සඳහා වෙලි සහ වැඩිදියුණු කළ ජල බෙදා හැරීමේ ජාලවල ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරීව යොමු වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ජල පෝෂක සහ ජල සම්පත් කළමනාකරණය, වේලි ආරක්ෂාව ආශ්‍රිත යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්, හදිසි අවස්ථා ප්‍රතිචාර සහ ව්‍යාපෘති කළමනාකරණය යන සංරචක හතරක් යටතේ ක්‍රියාත්මක වේ.**

**ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ. ඩො. මිලියන 75.03 ට සමාන රු. මිලියන 14,199.43 ක් වන අතර ඉන් ඇ. ඩො. මිලියන 69.53 ට සමාන රු. මිලියන 13,158.55ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි මුදල රු. මිලියන 1,040.88 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කෙරේ.**

**ව්‍යාපෘතිය 2021 මැයි 13 වන දින එහි කටයුතු ආරම්භ කර 2025 ඔක්තෝබර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.**

**1.3 මතය**

**ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

**2.** භෞතික කාර්යසාධනය

**2.1** වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| කියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්ය සාධනය<br>ඒකක / ප්‍රතිශතය | කාර්ය සාධනය ලබා ඇත<br>ඒකක / ප්‍රතිශතය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|
| 2021–2025 කාලය තුළ ඇ. ඩොලර් මිලියන 49.2 ක ප්‍රතිපාදන යටතේ ප්‍රධාන වැඩ 44 ක් ක්‍රියාත්මක කිරීම. | 2022 වසරේ පැකේජ 64ක් පිරිනැමීමට සැලසුම් කර තිබුණි. | 17 පැකේජ | පැකේජ 64 න් 47 ක් ප්‍රදානය කර නොතිබුණි. | ජලාශ වේලි, ඇළ මාර්ග පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම්, උපකරණ සහ එසවුම් යන්ත්‍ර සැපයීම සහ ස්ථාපනය කිරීම ප්‍රමාද වීම. |

කළමනාකාරිත්වයේ දැක්වීම — අසහස් පහත සඳහන් තත්ත්වයන් හේතුවෙන් සැලකිය යුතු ප්‍රමාදයක් සිදු විය.

i. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් කොන්ත්‍රාත් පැකේජ 6 ක් නැවත ටෙන්ඩර් කිරීමට බල කර තිබීම.

ii. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන වැඩවලට අදාළව, කොන්ත්‍රාත් පැකේජ 08 ක් 2022 දී ප්‍රදානය කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි.

iii. උතුරු පළාත් සභා වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ප්‍රධාන වැඩ 12 න් කොන්ත්‍රාත් පැකේජ 07 ක් ප්‍රදානය කිරීමට හැකි වූ අතර ලෝක බැංකු අවශ්‍යතා අසම්පූර්ණ නොකිරීම හේතුවෙන් ID-EPC වෙතින් කොන්ත්‍රාත් පැකේජ 10 ක් ප්‍රදානය කර නොතිබුණි.

විගණයේ නිර්දේශ — ප්‍රසම්පාදන සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුය.

**2.2** කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන ගැටළුව | කළමනාකාරිත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහවැලි අධිකාරිය විසින් දේශීය සමාගමකට කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණේ රු. මිලියන 536.17කට කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සඳහාය. වලව ප්‍රධාන ඇළේ ස්ථාන 02 ක වැඩිදියුණු කිරීම් සඳහා රු. මිලියන 610.44 (බදු සහිතව). ඉදිකිරීම් ප්‍රගතිය සියයට 13 ක් සහ සියයට 6.5 ක දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් 2023 අප්‍රේල් 28 වැනි දින මහවැලි අධිකාරිය විසින් මෙම කොන්ත්‍රාත්තු 02 අවලංගු කරන ලදී. අදාළ අත්තිකාරම් ඇපකර සහ කාර්ය සාධන ඇපකර රු. මිලියන 237.91ක් අදාළ බැංකුවලින් අයකරගෙන තිබුණි. එසේ වුවද, කාර්යය ඉටු කිරීමේ අරමුණ ඉටු කරගෙන නොතිබුණි. | 2023 අප්‍රේල් 28 වන දින කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට ක්‍රියා පටිපාටි අනුගමනය කර ඇති අතර කොන්ත්‍රාත්තුවේ කොන්දේසි වලට අදාළව අත්තිකාරම් ඇපකරය, කාර්ය සාධන සහතිකය සහ ESHS ඇපකරය 2023 මැයි 22 වන විට අහිමි කර තිබුණි. එසේ වුවද, අවසන් කරන ලද කොන්ත්‍රාත්තුවලට අදාළ ඉතිරි වැඩ නැවත ටෙන්ඩර් කිරීමෙන් අවසන් කිරීමට තීරණය විය. ඒ අනුව, ඉතිරි වැඩ සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු නැවත ටෙන්ඩර් කිරීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයට ලැබී ඇත. | (i) කොන්ත්‍රාත්කරු අසාදු ලේඛණ ගත කළ යුතුය.<br>(ii) ලෝක බැංකු මාර්ගෝපදේශ අනුව නව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගත යුතුය. |
| (ආ) | 2022 අගෝස්තු 08 වැනි දින මහවැලි අධිකාරිය විසින් කොත්මලේ සහ රන්දෙණිගල වේලි වල | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව 2023 මාර්තු 20 වැනි දින කොන්ත්‍රාත්තුව | හැකි ඉක්මනින් ලෝක බැංකු මාර්ගෝපදේශ |

| | | | |
|---|---|---|---|
| | ස්වයංක්‍රීය භූගත වේල්ල අධීක්ෂණ සමීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුවක් නෙදර්ලන්තයේ සමාගමකට එ.ජ.ඩොලර් **1,749,791** කට සමාන රු. මිලියන **629.92** කට ප්‍රධානය කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව මිල ගණන් ඉදිරිපත් කර මාස **11** කට පසුව ලබා දී ඇති අතර කොන්ත්‍රාත්තුවේ එ.ජ.ඩොලර් **2,484,969** දක්වා වැඩි කර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරන ලෙස කොන්ත්‍රාත්කරු ඉල්ලා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව ආරම්භ නොකිරීම සහ කාර්ය සාධන සහතික ලබා නොදීම සහ කොන්ත්‍රාත් ගිවිසුමට එළඹීමට අපොහොසත් වීම වැනි කරුණු මත මහවැලි අධිකාරිය විසින් **2023** පෙබරවාරි **24** දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. | අවසන් කිරීමට සහ ලංසු සුරැකුම අහිමි කිරීමට ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අනුගමනය කර ඇත. එසේ තිබියදීත්, ඉහත වැඩ නැවත ටෙන්ඩර් කිරීමට එකඟ විය. | අනුව කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගත යුතුය. |
| (ඇ) | කලාවැව වම් ඉවුර ඇළ ගේට්ටු අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව වසරක් ඇතුළත අවසන් කිරීමට හවුල් ව්‍යාපාර සමාගම් **02**ක් වෙත ලබාදී තිබූ අතර එහි වටිනාකම රු. මිලියන **177** ක් විය. අදාළ කොන්ත්‍රාත්තුව **2023** ජනවාරි **23** දින අවසන් කළ යුතුව තිබුණද, **2022** වසර අවසානයේදී ඉදිකිරීම් ප්‍රගතිය සියයට **12**ක් වූ අතර කොන්ත්‍රාත්තුව **2023** ජූලි **23** දක්වා දීර්ඝ කර තිබුණි. | පෙර නොවූ විරූ ආර්ථික අර්බුදය හේතුවෙන් වානේ මිල අහස උසට නැඟුණු බැවින්, මිල ඉහළ යාම සඳහා වන්දි ගෙවීමට කොන්ත්‍රාත්තුවේ මිල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීය. ඊට අමතරව, ආනයන සීමා කිරීම් සහ ඩොලර් හිඟය හේතුවෙන් වානේ සහ ගියර් පෙට්ටි හිඟතාවයක් ඇති විය. එය **2022** දෙසැම්බර් දක්වා පැවති අතර ඉදිකිරීම් කටයුතු සැලකිය යුතු ලෙස මන්දගාමී විය. | ලෝක බැංකුවේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මගින් ජල පෝෂක කළමනාකරණ සැලසුම්වලින් සියයට **53**ක් සහ බහු අංශ ජල සම්පත් සැලසුම්වලින් සියයට **41**ක් සිදු කිරීමට සැලසුම් කර තිබුණද එම වැඩ කොටස් සිදු කර නොතිබුණි. මෙම සම්පූර්ණ වැඩසටහන් සඳහා පිළිවෙළින් ඇ. ඩො. මිලියන **06**ක් සහ ඇ. ඩො. මිලියන **7.70**ක් ප්‍රතිපාදන ලබා දී තිබුණි. **2008-2018** කාලය තුළ ලෝක බැංකුවේ මූල්‍ය පහසුකම් යටතේ ක්‍රියාත්මක වූ වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය යටතේ ද මෙම වැඩසටහන් **02** ක්‍රියාත්මක කර තිබුණි. | සංරචක **1.1** යටතේ, ඉහළ මහවැලි ජල පෝෂක කළමනාකරණ සැලැස්ම සකස් කිරීම සඳහා උපදේශන සේවාව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශක ප්‍රසම්පාදන කමිටුව හරහා ප්‍රසම්පාදනය කෙරේ. විවිධ හේතූන් මත අපට අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත්, ඊට **2023** ජූලි **4** වැනි දින කැබිනට් අනුමැතිය ලැබී ඇත. මේ අතර, ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශයේ කිසිදු මූලික අධ්‍යයනයක්/වැඩක් සිදු කර නොමැත. | **(i)** ජල පෝෂක කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේදී, කාර්යයන් සඳහා බලපෑ සියලු කරුණු සැලකිල්ලට ගත යුතුය.<br><br>**(ii)** වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | රු. මිලියන **17.37**ක කොන්ත්‍රාත්තු දෙකක් සහ උතුරු හා නැඟෙනහිර පළාත්වල වැව් සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තු **13**කට අදාළව පාරිසරික හා සමාජ කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා පසුගිය කාලයේ මූල්‍ය දුර්වලතා සහ පාඩු ලැබූ උපදේශක ආයතනයකට රු. මිලියන **16.81**ක් | යෝජනා ඇගයීමේදී **CPCM** විසින් සටහන් කර ඇත්තේ මුල් ඉංජිනේරුගේ ඇස්තමේන්තුව රු. **9,065,000**ක් වන අතර, එහි වාරි ඉංජිනේරු/ජල සම්පත් ඉංජිනේරු යෙදවුම් සඳහා ප්‍රතිපාදන නොතිබූ අතර ඉන්ධන මිල ඉහළ යාම සහ උග්‍රවීම සඳහා ගණන් නොගෙන ඇත. | **(i)** මූල්‍යමය වශයෙන් ශක්‍ය කොන්ත්‍රාත්කරුවන් තෝරා ගත යුතුය.<br><br>**(ii)**ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා ඇති බව මත පදනම්ව |

| | | | |
|---|---|---|---|
| | ගෙවා තිබුණි. මෙයින් උතුරු පළාතේ ඇස්තමේන්තුගත කොන්ත්‍රාත්තුව රු. මිලියන 9.07 ක් වන අතර එය පසුව රු. මිලියන 13.3 කට සංශෝධනය කර තිබුණි, නමුත් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය යෝජනා අනුව කොන්ත්‍රාත්තුව රු. මිලියන 16.82 කට ප්‍රධානය කර තිබුණි. ඒ අනුව පළාත් 02 ක කෙටුම්පත් වාර්තා 13 ක් නිකුත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් වාර්තා නිකුත් කර නොතිබුණි. | එබැවින් ඉංජිනේරු ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට CPCM යෝජනා කර ඇත. ඒ අනුව, සංශෝධිත ඇස්තමේන්තුව 2022 ජූනි 8 වැනි දින කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. සංශෝධිත ඉංජිනේරු ඇස්තමේන්තුව මත පදනම්ව, කොන්ත්‍රාත් සාකච්ඡා සිදු කර රු. 16,818,880 ඉන්ධන හිඟය සහ කොන්ත්‍රාත් සාකච්ඡා අවස්ථාවේ වෙළඳපල මිල ගණන් වල අවිනිශ්චිතතාවය හේතුවෙන්. අවසානයේදී, නැඟෙනහිර පළාතේ වේලි සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පාරිසරික කළමනාකරණ සහ සමාජ කළමනාකරණ සැලැස්ම සහ පාරිසරික හා සමාජ පරීක්ෂණ වාර්තාව සැකසීම සඳහා උපදේශන සේවාව 2022 ජූනි 20 දින රු. 16,818,880 කට ප්‍රධානය කර තිබුණි. | කොන්ත්‍රාත්තු ප්‍රදානය කළ යුතු අතර, අලාභය අදාළ නිලධාරීන්ගෙන් ආවරණය කළ යුතුය. |
| (ඊ) | ශේෂ පත්‍ර දිනයෙන් පසු අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇති පරිදි අයවැයට සහය දැක්වීම ඇතුළු අපේක්ෂිත නව ක්‍රියාකාරකම් සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමයට ලබා දී ඇති මුදලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 25ක් සහ ගිණුම් ඉදිරිපත් කිරීමේ කාලසීමාව තුළ අවලංගු කිරීමට අනුමැතිය ලැබී තිබුණි. තවද, ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණු ඉක්මවා නොයන ලෙස රටේ පවතින අර්බුදකාරී තත්ත්වය සමනය කිරීම සඳහා අවශ්‍ය කටයුතුවල නිරතවීම සඳහා ඇ. ඩො. මිලියන 10කට වැඩි මුදලක් ප්‍රතිපාදනය කිරීමට තීරණය කර තිබුණි. ඊට අමතරව දැනට ව්‍යාපෘතිය සඳහා ඉල්ලුම් කර ඇති ඇ. ඩො. මිලියන 05ක දේශීය අරමුදල් අවලංගු කර ඒ වෙනුවට ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් මුදල් ලබා ගැනීමට කටයුතු කරමින් තිබූ අතර 2023 මැයි 18 වන විට පවා මෙම නව තත්ත්වය ඇතුළුව සංශෝධිත ණය ගිවිසුම අත්සන් කිරීම සිදු කර නොතිබුණි. | දැනට ක්‍රියාත්මක ලෝක බැංකුවේ ව්‍යාපෘති ප්‍රතිනිර්මාණය කිරීම සහ අවලංගු කිරීම පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශයක් මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති අතර ඇමෙරිකානු ඩොලර් 25ක මුදලක් අවලංගු කිරීමට තීරණය කර ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය මත ERD විසින් මූල්‍ය ගිවිසුම සංශෝධනය කරන ලෙස ඉල්ලා ලෝක බැංකුවට ලිපි යවා ඇති අතර දැනට ලෝක බැංකුව කෙටි කාලයක් තුළ මූල්‍ය ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කරමින් සිටී. | සංශෝධිත ණය ගිවිසුම කඩිනමින් අත්සන් කළ යුතු අතර ඒ අනුව වැඩසටහන් සංශෝධනය කළ යුතුය. |
| (උ) | 2018 වර්ෂයේ ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේදී පොල්ගොල්ල සහ උඩවල ජලාශ වේලි ස්ථිර ස්ථාපනය සඳහා ගැන්ට්‍රි දොඹකර 02ක් අවශ්‍ය බව මහවැලි අධිකාරිය දැනුම් දී තිබිණි. 2021 | මූල්‍ය ඇගයීම් වාර්තාව 2022 ජනවාරි 24 වන දින TEC විසින් DPC වෙත ඉදිරිපත් කරන ලද අතර, පසුව, 2022 පෙබරවාරි 3 වන දින අනෙකුත් ලංසුකරුවන්ගෙන් | මිල ගණන් කැඳවීමෙන් පසු කෙටි කාලයක් තුළ කොන්ත්‍රාත් ප්‍රධානය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අගෝස්තු 24 දින මහවැලි අධිකාරිය විසින් එය මාස 07 කට පසු මිලදී ගැනීම සඳහා සමාගමකට රු. මිලියන 797.61 ක මුදලක් ලබා දී ඇත. මහවැලි අධිකාරිය විසින් අදාළ කොන්ත්‍රාත්තුව ලබාදීමට දීර්ඝ කාලයක් ගතවී ඇති බැවින් ඉදිරිපත් කළ මිල ගණන් යටතේ මෙම කොන්ත්‍රාත් 02 ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර කොන්ත්‍රාත්කරු විසින් මෙම කොන්ත්‍රාත් 02 ක්‍රියාවට නැංවීමට එකඟ වී තිබුණේ රු. මිලියන 1,248.37 ක් සහ වත්මන් අවප්‍රමාණය හේතුවෙන් සියලු වියදම් ඉහළ යාමේ දී එ.ජ.ඩොලර් 1,134,485 කටය. ඒ අනුව මහවැලි අධිකාරිය මෙම කොන්ත්‍රාත් 02 ක්‍රියාත්මක කිරීමට අදාළ කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්වලට එළැඹ තිබුණේ පෙර මිලට වඩා රු. මිලියන 450.76ක් වැඩි යෙණි. එ.ජ.ඩොලර් 206,270 ට සමාන රුපියල් මිලියන 127.32 ක මුදලක් ද ආරම්භක අත්තිකාරමක් ලෙස ව්‍යාපෘතිය මගින් ගෙවා තිබුණි. මහවැලි අධිකාරියේ ජලාශ වේලිවල දැනට පවතින ගේට්ටු අලුත්වැඩියා කිරීමේදී එම ගේට්ටු එසවීම සඳහා අධිකාරියේ ප්‍රධාන වැඩ අංශයේ ජංගම දොඹකර මේ දක්වා භාවිත කරමින් තිබිණි. | ලැබුණු පැමිණිලිවලට අදාළව ලෝක බැංකුවේ උපදෙස් මත DPC විසින් ක්‍රියාවලිය පවත්වන ලදී. අවසානයේදී, නිෂ්කාශනය ප්‍රසම්පාදන ක්‍රියාවලිය දිගටම කරගෙන යාමට ලෝක බැංකුවට 2022 පෙබරවාරි 20 වැනි දින ලැබුණි. ඉන් පසුව, DPC හි අනුමැතිය යටතේ DG, MASL විසින් 2022 අප්‍රේල් 8 වන දින M/S Indo East Engineering & Construction (Lanka) Pvt Ltd වෙත කොන්ත්‍රාත්තු දෙකම ප්‍රදානය කරන ලදී. පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයක් මධ්‍යයේ 2021 ජූලි 4 වන දින ලංසු කැඳවා 2022 අප්‍රේල් 8 වන දින ප්‍රදානය කරන ලද බැවින්, කොන්ත්‍රාත්කරු ගැන්ට්‍රි දොඹකර ආනයනය කිරීමේ කොන්ත්‍රාත්තුවලට මිල හදිසි අවස්ථා සහ බහු මුදල් වර්ග ඇතුළත් නොකර LOA පිළිගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. මෙම කොන්ත්‍රාත් දෙකම ජාතික මට්ටමේ වේලි මෙහෙයුම් වලදී ඉතා වැදගත් වන බැවින් 2022 අගෝස්තු 10 වන දින PAC සහ බහු මුදල් ඇතුළත් කරමින් කොන්ත්‍රාත්තුව සංශෝධනය කිරීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව "විරෝධතාවක් නැත" නිකුත් කරන ලදී. කොන්ත්‍රාත්තුව 2022 අගෝස්තු 17 වන දින ලෝක බැංකුවට නැවත ලංසු තැබීමට වඩා.<br>ලිපියට ප්‍රතිචාරයක් ලෙස, ජාතික අවශ්‍යතාවය සලකා බලා කොන්ත්‍රාත්තුව සංශෝධනය කිරීමට ලෝක බැංකුව අවසර දී තිබුණි. WB උපදෙසට අනුව, PAC LKR සංරචකයට ඇතුළත් කර ඇති අතර, එය මිල වැඩිකිරීම් මත විෂය පථය වන අතර, මේ අතර, ගැන්ට්‍රි දොඹකර ආනයනය USD වලින් ලබා දී ඇති අතර එහිදී මිල අවිනිශ්චිතතාවයට ඉඩ නොදුනි. ඒ අනුව 2022 නොවැම්බර් 15 වැනි දින ගිවිසුම් ගිවිසුම් අත්සන් කර තිබුණි. | |
| (ඕ) | මේ අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩකටයුතුවලට අයත් අරාවත්ත වැව් බැම්ම වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය සමාලෝචිත වර්ෂයේදී අවසන් කළ යුතු අතර එහි වටිනාකම රු. මිලියන 46.03 ක් සියයට 20 ක් වූ අතර, කොන්ත්‍රාත්තුව 2023 ජුනි 21 දක්වා | මෙම කොන්ත්‍රාත්තුව 2021 දෙසැම්බර් 23 වන දින ආරම්භ කරන ලද අතර එහිදී වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර ඇති අතර එහි පහළ බෑවුමේ ටොයි ෆිල්ටරය ඉදිකරන අතරතුර ඉහළ බෑවුමේ Rip Rap තබා වැව් බැම්ම ශක්තිමත් කර | හැකි ඉක්මනින් කොන්ත්‍රාත්තු අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. |

දීර්ඝ කර ඇත. එසේම, රුපියල් මිලියන 100 ක වටිනාකමකින් යුත් කොන්ත්‍රාත්තු 03 ක ප්‍රගතිය හේතුවෙන්. 2022 දෙසැම්බර් 31 දින නිම කළ යුතු උතුරු පළාත් සභාවට අයත් මුතියන්කඩු ඇළේ දකුණු ඉවුර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 397.31 ක මුදල සියයට 30 - සියයට 50 අතර ප්‍රමාණයක පැවති අතර කොන්ත්‍රාත්තුව 2023 ජූනි දක්වා දීර්ඝ කර ඇත. රු. මිලියන 81.33 ක් වටිනා එම පළාත් සභාවට අයත් කොන්ත්‍රාත්තු 02 ක ඉදිකිරීම් ප්‍රගතිය සියයට 15 සහ සියයට 40 මට්ටමේ පැවති බැවින් එහි කාලසීමාව ද 2023 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.

තිබුණි. බොහෝ ඉදිකිරීම් කාලසීමාව තුළ වැව සම්පූර්ණ සැපයුම් මට්ටමේ හෝ සැලකිය යුතු මට්ටමක පැවතියේ වගාව සඳහා ජලය නිකුත් කිරීමට බැඳී සිටි අතර විදුලිබල මණ්ඩලය විසින් විදුලි කණුව ඉවත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් පහළ බැවුමේ මුහුණත පෙරහන සිදු කිරීමට නොහැකි වූ බැවිනි. එබැවින් අනපේක්ෂිත ප්‍රමාදයන් හේතුවෙන් ඉදිකිරීම් කාලය දීර්ඝ කිරීමට සිදු විය. කෙසේ වෙතත්, විදුලි කණුව ඉවත් කරන ලද අතර, වර්තමාන භෞතික ප්‍රගතිය 75% කි. මීට අමතරව, මුදයන්කට්ටු පහළ ප්‍රදේශය පුනරුත්ථාපනය කිරීම යටතේ කොන්ත්‍රාත් අංක 3ක් ප්‍රදානය කරන ලද අතර, පිරිමන්තලරු යෝජනා ක්‍රමය සහ කනගාම්බිකෙයි යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොන්ත්‍රාත්තු 2ක් 2021 දෙසැම්බර් මාසයේදී දින 365ක ඉදිකිරීම් කාලයකින් ප්‍රධානය කරන ලදී.

කෙසේ වෙතත්, ඉදිකිරීම් ද්‍රව්‍ය පෙර නොවූ විරූ ලෙස මිල ඉහළ යාම හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ සියලුම අවසර ලත් මිල වැඩිවීම් අවසන් වූ අතර ඉන්ධන හිඟය සහ රටේ පැවති තත්ත්වය හේතුවෙන් පැකේජවල භෞතික ප්‍රගතිය මන්දගාමී විය. ලෝක බැංකුවේ එකඟතාවයෙන් සහ ලේකම්වරයාගේ අනුමැතියෙන් පසුව, 2023 මාර්තු 27 වැනි දින කොන්ත්‍රාත් සංශෝධන මගින් MOI මිල අවිනිශ්චිතතාවය වැඩි කරන ලදී. මේ වන විට සඳහන් කළ පැකේජවල භෞතික ප්‍රගතිය සතුටුදායක මට්ටමක පවතී.

## 2.3 ආර්ථික නොවූ ගණුදෙනු

| විගණන ගැටළුව | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින දක්වා භාවිත නොකළ සහනදායී පොලී ණය සියයට 81.73ක් සඳහා ආර්ථික නොවන ලෙස පොලී සහ බැඳීම් ගාස්තු රු. මිලියන 27.2ක් ගෙවා | සහනදායී ණය යටතේ ආපසු ලබාගත් ණය ශේෂය සඳහා පොලී ගාස්තු ගෙවිය යුතු වේ, අනුපාතිකය සහ විචල්‍ය ව්‍යාප්තිය හෝ සහනදායී නොවන ණය යටතේ අදාළ විය හැකි පරිවර්තන සාධකයක්. කෙසේ වෙතත්, මූල්‍ය ගිවිසුමට අනුව, ඉදිරි ගාස්තු සහ පෙර | මූල්‍ය පාලනය ශක්තිමත් විය යුතුය |

| | | |
|---|---|---|
| තිබුණි. | සූදානම් කිරීමේ පහසුකම් ගෙවීම් - සහනදායී නොවන ණය යටතේ වර්ග කර ඇති මුළු USD 392,385 (66,750+325,635). පොලී ගාස්තුව රු. මිලියන 27.2 ක මෙම සහන රහිත මුදල මත ගණනය කරන ලද රු. 78,647,303 (USD 392,385) ERD මූල්‍ය වාර්තාවේ පෙන්වා ඇත. ඒ අනුව සහනදායී ණය ඉතුරුම් (81.73% කින්) ප්‍රයෝජනයට ගැනීමට ක්‍රමයක් නොතිබුණි. | |

**2.4** පද්ධති හා පාලන

| විගණන ගැටළුව | කළමනාකාරීත්වයේ අසහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේදී වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතියෙන් ලැබුණු ව්‍යාපෘති කාර්යාලය සඳහා භාවිත කරන ලද කාර්යාල උපකරණවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වත්මන් IWWRM ව්‍යාපෘතියට නිසි ලෙස මාරු කර නොමැති පැරණි DSWRP ව්‍යාපෘතිය විසින් භාවිතා කරන ලද වත්කම් විධිමත් කළ යුතුය. ඒ අනුව, එම වත්කම් තක්සේරු කිරීම සහ සත්‍යාපනය කිරීම සඳහා වාරිමාර්ග ලේකම්වරයා විසින් 2023 පෙබරවාරි 17 වන දින සිවිපුද්ගල කමිටුවක් පත් කර ඇත. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |